විද්‍යාලය : ර/ ඇරැපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දුර
නිර්දේශිත ග්‍රන්ථය : **සද්ධර්මාලංකාරය**

ප්‍රශ්නය : ''සාරධර්ම පෝෂණයෙහි ලා සර්වකාලීන උපදේශ ලබා දීම සද්ධර්මාලංකාර කතුවරයාගේ අරමුණකි.'' නියමිත කතා වස්තු ඇසුරෙන් විමසන්න.

**පිළිතුර සඳහා මග පෙන්වීම :**

- ග්‍රන්ථය, කතුවරයා, යුගය පිළිබඳ කෙටි විවරණයක යෙදෙන්න.
- ග්‍රන්ථය රචනා වූ හෝ පාලි රසවාහිනිය රචනා වූ යුගයට පමණක් සීමා නොවී අතීත වර්තමාන මෙන් ම අනාගත සමාජයටත් ධර්මකතා මගින් උපදෙස් ලබා දීම පැරණි බණ කතාකරුවාගේ අරමුණ විය. (සර්වකාලීන අගයකින් යුතු උපදෙස් දීම)
- යහපත් සමාජ පැවැත්මට ඉවහල් වන ජීවන පැවැත්ම, මෛත්‍රී සහගත බව, පරාර්ථ චර්යාව, කුලභේදයේ නිරර්ථකබව, න්‍යායාත්මක ජීවිතය නොව ප්‍රායෝගික ජීවිතය අද්දැකීම් තක්සලාවක් වන බව, අනුන් පිරිහෙළීම නිසා කර්ම විපාක ඵලදෙනබව, අනුන් විනාශ කිරීමට උත්සාහ කිරීම තුළින් තමා නොදැනුවත්ව ම තමාව විනාශයට පත්වීම, ධර්මානුකූල ජීවිතයක් ගත කිරීම තුළින් තමාට නිතැතින් ම සැපත, සතුට කීර්තිය ළඟා කර ගැනීමට හැකි වීම.
- ස්වර්ණතිලකා කතා වස්තුව - යහපත සමාජ පැවැත්ම
  ''මේ ලඞ්කාද්වීපයෙහි අනුරාධපුර නුවර ශ්‍රද්ධාවන්ත වූ එක්තරා ස්ත්‍රියක් නිරන්තරයෙන් මල් කඩා ගෙනවුත් අභයගිරි වෙහෙර දාගැබට පූජා කරන්නී ය.''
- කුලභේදයේ නිරර්ථක බව
  ''එම්බා මේ ලෝකවාසී සත්‍වතෙම අනඝ මුතුමැණික් ආදී වූ රත්නජාතීන් අමෙධ්‍යයෙහි හුණත් අපවිත්‍ර යැයි නින්දා කොට නො හරනේ ම ය;''
- අනුන් හෙළා පිරිහෙළා කීම තුළින් කර්ම විපාක පලදෙනබව
  ''චණ්ඩාල කෙල්ල'යි බිණුවාහු ද ඒ අකුසල කර්මය නිසා උත්තම ජාතීන් විසින් පිළිකුල් කටයුත්තා වූ හීන ජාතියෙහි චණ්ඩාල ව උපන්හ.''
- ප්‍රායෝගික ජීවිතය අද්දැකීම් තක්සලාවක් බව
  "එපවත් දැන රජ කුමරුවෝ නොසතුටු ව එපරිද්දෙන් ස්වර්ණතිලකා මරවා ගත නොහැකි සෙයින්, දෙවන දවස් මිනිසුන් යවා රාත්‍රී භාගයෙහි මරවා පීහ. එකල්හි ඒ උද්දාල බ්‍රාහ්මණයා ද මෙබඳු ස්ත්‍රී රත්නයකින් වියෝව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ'යි...."

★ **නන්දිවාණිජ කතා වස්තුව**

- යහපත් දිවියකට ඉවහල් වන දිවි පැවැත්ම
  "මේ කුණු ශරීරයෙන් තොපගේ අමාත්‍යයන්ට ඇති ප්‍රයෝජනය කිම් ද?"
  "එම්බා නැගණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේ යයි තොපගේ අමාත්‍යයාණන්ටත් නුගුණ ය; මෝ තොමෝ තමාගේ ගෙහිමියෝ ඉක්ම පවත්නී ය යි මටත් නින්දා වන්නෝය; මෙසේ වරදවා පිළිපැද්දාවුන් අපායෙනුත් නො මිදෙන්නාහු ම ය...."
- මෛත්‍රී සහගත බව/පරාර්ථ චර්යාව
  "එකල වෙළෙඳාණෝ ''එසේ වී නම් පින්වත්නි, තොප ඇම අප්‍රමාද ව මෛත්‍රිභාවනාව කරව; තොප හැමට මෛත්‍රිය හා සමාන අනික් පිළිසරණෙක් නැතැ'' යි...."
  "ඉක්බිති වෙළෙඳාණෝ නැවින් බැස ඇවිත් තමන්ගේ භාර්යයාවන් අතින් මෙහි පළමු කී කළ සියලු ප්‍රවෘත්තිය ම අසා අමාත්‍යා කෙරෙහි කරුණා උපදවා පින්පෙත් දී ජීවිතාන්තය දක්වා භාර්යයාවන් හා සමඟ නොයෙක් පිංකම් කෙරෙමින් සිල් රකිමින් ..... "
- අනුන් විනාශ කිරීමට උත්සාහ කිරීම තුළ තමාට ම විනාශය ළඟා වීම.
  "ඒකාන්තයෙන් ම මූ තමන්ගේ ගෙහිමියාණන් මළහොත් මා හා සමඟ වාසයට ලැබෙන්නී ම ය යි සිතා වෙළෙඳාණන් මරන්ට සිතනුයේ බොහෝ යකැදුරන් ගෙන්වා...."
  "එසේ ම සතර වන වාරයෙහි ආවේශ කරවා නික්ම වූ කල්හි ගොසින් වෙළෙඳාණන් කරා වැද්ද නොහී ආපස්සේ ඇවිත් අමාත්‍යයා හා යකැදුරා දෙපලු කොට පොලු ගසා....."
- යහපත් ජීවිතය සැපත සතුට කීර්තිය ගෙන දෙයි.
  "භාර්යයාවන් හා සමඟ බොහෝ පින්කම් කෙරෙමින් සිල් රකිමින් තමන්ගේ පරිවාර ජනයන් හා සමඟ දිව්‍යලෝකයෙහි උපන්නහ."